# සමගිය සතුට ගෙනේ



සවින්ද්‍යා වරණී කාරියවසම්

# සමගිය සතුට ගෙනේ

## සවින්දයා වරණී කාරියවසම්

කතෘ

පළමු දිගහැරීම

මහමායා බාලිකා විදුහල

1 ශ්‍රේණිය A

2025-02-08

ISBN අංකය- 978-624-208-605-7

# පිදුම

මාගේ දෙමව්පියන්ට ද,

පන්තිභාර චාමිනී ගුරු මෑණියන්ට ද

ආදරයෙන්

මෙම පොත පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එක කැලේක හිටියා හා පැංචෙකුයි, ලේන් පැංචෙකුයි, මුව පැටියෙකුයි.

ඒ තුන් දෙනා හරිම හොඳ යාළුවෝ.





එයාලා සෙල්ලම් කළේ කැලේ මැද තිබුන ලස්සන විලක් ලග.

ඉර පායන වෙලාවට නෙළුම් මල් පිපිලා හරිම ලස්සනයි.

ඒ විලේ හිටියා ලස්සන මාළු පැටියෙක්. එයාට නම් යාළුවෝ කවුරුත් හිටියෙ නෑ.



අම්මයි, තාත්තයි විතරයි එයාට හිටියේ.

ඉතින් මේ යාළුවෝ සෙල්ලම් කරන වෙලාවට මාළු පැටියා වතුරට වෙලා හරි ආසාවෙන් බලාගෙන ඉන්නවා.





දවසක් දා මාළු පැටියා අර යාළුවන්ට කතා කරලා “යාළුවනේ මටත් ඔය බෝලේ ටිකක් දාන්නකෝ.

මටත් ආසයි ඔයාලත් එක්ක සෙල්ලම් කරන්න ” කිව්වා.

ඒත් මේ යාළුවෝ ඒකට කැමති වුනේ නෑ. " ඔයා වතුරෙනේ ඉන්නේ. බෝලේ වතුරට දාන්න බෑ " කියල එයාලා ගොඩබිම ඉදලා සෙල්ලම් කළා.



මාළු පැටියට හරිම දුකයි.



එක පාරටම මුව පැටියා කකුලෙන් ගහපු පාරකට බෝලේ පෙරලිලා විලටම ගියා. පාවෙලා, පාවෙලා ඈතටම ගියා.

වතුරට ගිය බෝලේ ගන්න බැරිව යාළුවෝ හරි දුකෙන් බලාගෙන හිටියා.

ඒක දැකපු මාළු පැටියා ඉක්මනින් අර බෝලේ ගොඩබිම දිහාට තල්ලු කරගෙන ගියා.





යාළුවන්ට තේරුණා අපිට සතුටින් ඉන්න හැමෝගෙම උදව් ඕන වෙනවා කියලා.

එදා ඉදලා හැමදාම මුව පැටියයි ,හා පැංචයි, ලේන් පැටියයි එක්ක මාළු පැටියත් විලේ ඉදන් සතුටින් සෙල්ලම් කළා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN අංකය- 978-624-208-605-7